ක / තක්ෂිලා මධ්‍ය විද්‍යාලය - හොරණ

| 21 | S | II |
|---|---|---|

# Taxila Central College - Horana

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ. පෙළ) විභාගය - 2018 - ජුනි - පෙරහුරු පරීක්ෂණය

General Certificate of Education (Ad. Level)Examination, June 2018, Grade 13

## ආර්ථික විද්‍යාව II
## Economics II

පැය තුනයි
Three hours

- **අවම වශයෙන් එක් කොටසකින් ප්‍රශ්න 2වත් තෝරා ගනිමින් ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.**

**(අ කොටස)**

01.

(i) නිෂ්පාදන සම්පත් වර්ග කර ආර්ථික සම්පත් හා ආර්ථික නොවන සම්පත් අතර වෙනස දක්වන්න.

(ii) අවශ්‍යතා හා වුවමනා අතර වෙනස නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

(iii) සාධක ඵලදායිතාවය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? ඵලදායිතාවය තීරණය කරන සාධක මොනවාද?

(iv) ආවස්ථික පිරිවැය සංකල්පය පැහැදිලි කර එය හිඟකම සංකල්පයට සම්බන්ධ වන්නේ කෙසේදැයි දක්වන්න.

(v) සාමාජීය වෙළඳපල ආර්ථිකයක් හා සමාජවාදී වෙළඳපල ආර්ථික අතර වෙනස දක්වන්න.

(කොටසකට ලකුණු 04)

02. (i) සැපයුමේ මිල නම්‍යතාවය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? එය මනිනු ලබන්නේ කෙසේද?

(ii) ඉල්ලුම් නීතිය හා ඉල්ලුම් න්‍යාය අතර වෙනස පැහැදිලි කරන්න.

(iii) තරගකාරී වෙළඳපලක අලෙවි වන එක්තරා භාණ්ඩයකට අදාළ ඉල්ලුම් හා සැපයුම් තත්ව පහත දක්වේ.

| P (මිල) | Qd | Qs |
|---|---|---|
| 4 | 84 | 12 |
| 8 | 68 | 44 |

අ) ඉහත ඉල්ලුම් වක්‍ර සරල රේඛීය යයි උපකල්පනය කර අදාළ ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිත සඳහා සමීකරණ ගොඩනගන්න.

ආ) සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න.

ඇ) අදාළ භාණ්ඩය මත රජය ඒකකයට රු. 3/- බැගින් වූ බද්දක් නිෂ්පාදකයා මත පනවනු ලැබුවහොත් බද්දෙන් පසු සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න.

ඈ) බදු පැනවීමට පෙර පාරිභෝගික හා නිෂ්පාදන අතිරික්තය ගණනය කරන්න.

(iv) කෘෂිකාර්මික භාණ්ඩවල මිල අස්ථායිතාවයට බලපාන හේතු කවරේද?

(v) මිල අස්ථායිතාවය තහවුරු කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද?

03. (i) දිගුකාලීන නිෂ්පාදන ක්‍රියාවලියේ දී පරිමාණානුකූල පිරිමැසුම් ඇතිවීමට බලපාන හේතු මොනවාද?

(ii) ස්ථාවර පිරිවැය, මුළු පිරිවැය, විචල්‍ය පිරිවැය යන සංකල්ප අතර පවතින සම්බන්ධතාවය කවරේද?

(iii) නිෂ්පාදන ආයතනයක ස්ථාවර පිරිවැයේ ප්‍රධාන සංරචක කවරේද?

(iv) ඒකාධිකාරී වෙළඳපල හා ඒකාධිකාරී තරග වෙළඳපල අතර දක්නට ලැබෙන වෙනස්කම් 2ක් සඳහන් කරන්න.

(v) ප්‍රාමාණික ලාභය යනු කුමක්ද? ප්‍රාමාණික ලාභය ආරෝපිත පිරිවැයක් ලෙස සලකන්නේ මන්ද?

(කොටසකට ලකුණු 4 බැගින්)



Scanned by CamScanner

04.

(i) නිෂ්පාදනය මත පනවන බදු හා නිෂ්පාදනය මත පනවන වෙනත් බදු අතර වෙනස දක්වන්න. (ල.04)

(ii) ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? (ල.04)

(iii) ජාතික ගිණුම්කරණයේ දී නිරීක්ෂණය නොකරන ආර්ථික කටයුතු වලට අයත් ආර්ථික ක්‍රියා නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ල.04)

(iv) කල්පිත ආර්ථිකයක් පිළිබඳව පහත දත්ත සපයා ඇත.

| | |
|---|---|
| වැටුප් හා වේතන | 275 |
| පෞද්ගලික ආදායම් බදු | 310 |
| ගොවීන්ගේ ආදායම් | 27 |
| පොලී ආදායම් | 38 |
| රජයේ සංක්‍රාම ගෙවීම් | 240 |
| සමාගමික ලාභ බදු | 40 |
| භාණ්ඩ හා සේවා මත ශුද්ධ බදු | 75 |
| නිෂ්පාදනය මත වෙනත් බදු | 50 |
| නොබෙදූ සමාගමික ලාභ | 15 |
| ස්වයං රැකියා ආදායම් | 30 |
| ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජන | 60 |
| ශුද්ධ විදේශ ප්‍රාථමික ඉපයීම් | -20 |

පහත සඳහන් දෑ ගණනය කරන්න.

i. වෙළඳ මිලට දල ජාතික ආදායම
ii. වෙළඳ මිලට දළ දේ. නිෂ්පාදනය
iii. වෙළඳ මිලට ශුද්ධ ජාතික ආදායම
iv. කුටුම්භ ආදායම
v. වැයකළ හැකි කුටුම්භ ආදායම

(කොටසකට ලකුණු 02)

05.

(i) කල්පිත ආර්ථිකයක් පිළිබඳ දත්ත පහත දී ඇත.

| | |
|---|---|
| C = 100 + .9 yd | I = 150 |
| G = 200 | T = 100 |
| X = 60 | M = 20 |

පහත සඳහන් දෑ ගණනය කරන්න.

i. සමතුලිත ජාතික ආදායම් මට්ටම
ii. අයවැය ශේෂය
iii. සමතුලිතයේ දී ඉතුරුම්
iv. විදීම් හා කාන්දුවීම් (W හා J)
v. වෙළඳ ගිණුමේ ශේෂය

(කොටසකට ලකුණු 02 බැගින්)

(ii) රාජ්‍ය කටයුතු සහිත ආර්ථිකයක C = 200 + 0.8yd

(අ) ස්ථාවර බදු 100 ක් නම් බද්දෙන් පසු පාරිභෝජන ශ්‍රිතය දක්වන්න. (ල.03)

(ආ) ආදායමෙන් 10% බදු අය කරයි නම් බද්දෙන් පසු පරිභෝජන ශ්‍රිතය දක්වන්න. (ල.03)

(iii) සාර්ව ආර්ථික සමතුලිතය වෙනස් වීම කෙරෙහි බලපාන සාධක මොනවාද? (ල.04)



Scanned by CamScanner

"ආ" කොටස

06.

i. ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය හා පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනය අතර වෙනස දක්වන්න. (ල.04)

ii. මුදලේ අගය යන්නෙන් කුමක් අදහස්වේද? එය මිල මට්ටමට සම්බන්ධ වන්නේ කෙසේද? (ල.04)

iii. වාණිජ බැංකුවක ද්‍රවශීලතාව සුරක්ෂිත කිරීම හා ලාභ ඉපයීම අතර ගැටුම පැහැදිලි කරන්න. (ල.04)

iv. ආවෘත ආර්ථිකයක බැංකු පද්ධතිය තනි වාණිජ බැංකුවකින් පමණක් සමන්විත වේ යැයිද, බැංකුව 10% ක සංචිත අනුපාතයක් යටතේ කටයුතු කරන අතර ගනුදෙනුකරුවන් රු. 10,000 ක මුදලක් බැංකුවේ අලුතින් තැන්පත් කරන්නේ යැයි ද සලකන්න. රට තුළ සංසරණය වන ව්‍යවහාර මුදල් ප්‍රමාණයේ වෙනස්කම් කිසිවක් පසුව නොවේ යැයි උපකල්පනය කළහොත්

(අ) මෙම තැන්පතුව නිසා බැංකුවට ලබාදිය හැකි උපරිම ණය ප්‍රමාණය කොපමණද? (ල.02)

(ආ) තැන්පතු ප්‍රසාරණ ගුණකය කොපමණද? (ල.02)

v. මහ බැංකුවේ විවට වෙළඳපොළ කටයුතු බැංකු පද්ධතියේ සංචිත මට්ටම කෙරෙහි බලපාන්නේ කෙසේද? (ල.04)

07. i. පොදු භාණ්ඩ යනු මොනවාද? මෙම භාණ්ඩ වෙළඳපොළ ක්‍රමය මගින් නොසපයන්නේ ඇයි? (ල.04)

ii. බාහිර පිරිවැය හා බාහිර ප්‍රතිලාභ යන සංකල්ප උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ල.04)

iii. සංඛ්‍යාත්මක උදාහරණයක් ආශ්‍රයෙන් ප්‍රතික්‍රම බදු ක්‍රමයක සාපේක්ෂ බදු මුදල අඩුනොවන බව පැහැදිලි කරන්න. (ල.04)

iv. ආර්ථික වර්ගීකරණයට අනුව ප්‍රාග්ධන වියදමෙහි උප ශීර්ෂ දක්වන්න. (ල.04)

v. අයවැය හිඟයේ ආර්ථික පිරිවැය දක්වන්න. (ල.04)

08. i. පහත වගුවේ A හා B රටවල් දෙක විසින් X හා Y භාණ්ඩ නිෂ්පාදන ඒකකයක් වෙනුවෙන් භාවිතා කරන සංයුක්ත සම්පත් ඒකක ප්‍රමාණය පෙන්නුම් කරයි.

| භාණ්ඩය | A රට | B රට |
|---|---|---|
| X | 100 | 300 |
| Y | 200 | 400 |

(අ) X හා Y භාණ්ඩ සම්බන්ධයෙන් නිරපේක්ෂ වාසි පවතින්නේ කවර රටවල් වලටදැයි දක්වන්න.

(ආ) X හා Y භාණ්ඩ සම්බන්ධයෙන් සාපේක්ෂ වාසි පවතින්නේ කවර රටවල් වලටදැයි දක්වන්න.

(ඇ) රටවල් අතර අභ්‍යන්තර හුවමාරු අනුපාතය දක්වන්න.

(ඉ) වාසිදායක හුවමාරු අනුපාතය දක්වන්න.

(ල.08)



Scanned by CamScanner

ii. පහත සඳහන් ගනුදෙනු ද්විත්ව සටහන් මූලධර්මයට අනුව ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ ලේඛනයේ වාර්තා කරන්නේ කෙසේද?

(අ) ශ්‍රී ලාංකික සමාගමකට තමන් සතුව මැදපෙරදිග ඇති ඇඟලුම් කර්මාන්තශාලාවකින් රුපියල් මිලියන 40ක ලාභාංශයක් ලැබීම.

(ආ) ශ්‍රී ලාංකික නිෂ්පාදන ආයතනයක් ඇමරිකන් ඩොලර් මිලියන 10 ක් වටිනා රෙදි එක්සත් රාජධානියේ සමාගමකට අපනයනය කිරීම

(ල.04)

iii. ආරක්ෂණයට විපක්ෂව කරුණු දක්වන්න. (ල.04)

iv. කළඹ ආයෝජන හා සෘජු ආයෝජන අතර වෙනස දක්වන්න. (ල.04)

09. i. ඉහළ ආර්ථික වෘද්ධි වේගයක් සඳහා ආර්ථිකයක් විසින් සපුරාගත යුතු අවශ්‍යතා කවරේද? (ල.04)

ii. මානව සංවර්ධනය හා තිරසාර සංවර්ධනය හඳුන්වමින් ඒවායේ මානයන් දක්වන්න.

(ල.04)

iii. බහුමාන දරිද්‍රතා දර්ශකය සකස් කරන්නේ කෙසේද? (ල.04)

iv. නිරපේක්ෂ දරිද්‍රතාව හෙවත් දිළිඳු බව නිර්වචනය කරනු ලබන්නේ කෙසේද? (ල.04)

v. ආර්ථික වශයෙන් සක්‍රිය ජනගහනය සහ ආර්ථික වශයෙන් සක්‍රිය නොවන ජනගහනය අතර වෙනස පෙන්වා දෙන්න. (ල.04)

10. i. දේශීය කෘෂිකර්මාන්තයේ ප්‍රධාන ගැටළු දක්වන්න. (ල.05)

ii. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ අපේක්ෂා හා අභියෝග කවරේද? (ල.05)

iii. ජනගහනය වියපත් වීමේ සමාජ ආර්ථික බලපෑම කවරේද? එය අවම කිරීම සඳහා සුදුසු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ලෙස ඔබ හඳුනා ගන්නේ මොනවාද? (ල.04)

iv. ශ්‍රී ලංකාවේ ආයෝජන වාතාවරණය තුළ ඇති බාධක හා අවස්ථා පෙන්වා දෙන්න. (ල.04)

-(-4)



Scanned by CamScanner

WWW.LOL.LK

# BUY

## PAST PAPERS

071 777 4440

Buy Online - www.LOL.lk

- GCE O/L
- GCE A/L
- PAST PAPERS
- SHORT NOTES



Protect Yourself From Coronavirus

# YOU STAY AT HOME




# WE DELIVER!

**ORDER NOW**

**075 699 9990**

**WWW.LOL.LK**

LOL.lk
Learn Ordinary Level

**TOP CATEGORIES**

- GCE O/L Exam NEW
- Grade 09, 10 & 11
- Grade 06, 07 & 08
- Grade 04 & 05
- Grade 01, 02 & 03
- About Us
- Shop HOT
- Cart

**HUGE SALE – SHOP NOW**




**ISLANDWIDE DELIVERY**
Free delivery on all orders over Rs. 3500

**More than 1000+ Papers**
For all major Subjects and mediums

**ONLINE SUPPORT 24/7**
Shopping Hotline 071 777 4440

## FEATURED PRODUCTS

**SORT BY**

- GCE O/L Exam




GCE O/L EXAM, SCIENCE
O/L Science Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART





GCE O/L EXAM, MUSIC
O/L Music Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, MATHEMATICS
O/L Mathematics Past Paper Book
රු 350.00
– 1 + ADD TO CART




GCE O/L EXAM, INFORMATION & COMMUNICATION TECHNOL...
O/L Information & Communication Tec...
රු 350.00




GCE O/L EXAM, HISTORY
O/L History Past Paper Book
රු 350.00




GCE O/L EXAM, HEALTH & PHYSICAL EDUCATION
O/L Health & Physical Education Past P...
රු 350.00